2009.12.15

## සමෘද්ධි චක්‍රලේඛ අංක :- 2010/ 01

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

සහකාර සමෘද්ධි කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ

ප්‍රාදේශීය ලේකම්/ ප්‍රාදේශීය නියෝජ්‍යය සමෘද්ධි අධ්‍යක්ෂ

සමෘද්ධි කළමණාකරුවන්

සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත.

# ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2010

### 01.ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

මහින්ද චින්තන වැඩසටහනට සමගාමීව සමෘද්ධිමත් ස්වයංපෝෂිත ගමක් නිර්මාණය කිරීමේ ගම නැගුම වැඩසටහනේ ජාතික ඉලක්කය සපුරාලීමේ අරමුණින් ජීවනෝපාය සංවර්ධනය උදෙසා 2010 වර්ෂයේදී කෘෂි සංවර්ධන, සත්වපාලන හා ධීවර, කර්මාන්ත සංවර්ධන, අලෙවි හා සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. 2010 වර්ෂය තුළද 2009 වර්ෂයේදී තෝරා ගන්නා ලද ගම් 3060 ට අදාළ ගම්මාන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ සඳහා මූලික මඟ පෙන්වීම් ඇතුළත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට අදාළ චක්‍රලේඛය මේ සමඟ ඉදිරිපත් කරමි. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ප්‍රධාන වශයෙන් කොටස් 2 ක් යටතේ ක්‍රියාත්මක වේ.

- ගම නැගුම සමෘද්ධි ග්‍රාම නිලධාරි වසම් 3060 ඉලක්ක කරගත් වැඩසටහන
- ගම නැගුම සමෘද්ධි වසම් 3060ට පරිබාහිර ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

### 2. අරමුණු

01. ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම් ලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම තුළින් ඔවුන් සවිබල ගැන්වීම
02. ස්වයං රැකියා ව්‍යාපෘති ප්‍රවර්ධනය තුළින් අදායම් වර්ධනය

03. කුසලතා හඳුනා ගෙන නව තාක්ෂණය, කළමණාකරණය හා වෙළඳපොල පිළිබඳ දැනුම වර්ධනය කිරීම.

04. අඩු ආදායම් ලාභීන්ගේ නිෂ්පාදන සඳහා අලෙවි පහසුකම් සැලසීම.

05. ප්‍රාදේශියව විසිරී ඇති සම්පත් හා විභව ශක්තීන් ඒකරාශී කර ජාතික නිෂ්පාදනයට ඵලදායීව යොදා ගැනීම.

06. දේශිය බෝග වගාව හා සත්ත්ව නිෂ්පාදන ඇසුරින් අඩු ආදායම්ලාභී පවුල් වල සෞඛ්‍ය හා පෝෂණ මට්ටම ඉහළ නැංවීම.

07. අඩු ආදායම්ලාභීන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම මඟින් රටේ සංවර්ධනයට දායක කර ගැනීම.

## 3. ප්‍රධාන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්

3.1 කෘෂි සංවර්ධන වැඩසටහන.

3.2. සත්ත්ව පාලන හා ධීවර සංවර්ධන වැඩසටහන.

3.3 කර්මාන්ත සංවර්ධන වැඩසටහන.

3.4.අලෙවි හා සේවා සංවර්ධන වැඩසටහන.

### 3.1 කෘෂි සංවර්ධන වැඩසටහන

ජාතික සවිය ගම නැගුම වැඩසටහනට සමගාමීව ස්වංපෝෂිත ගමක් නිර්මාණය කිරීමේ මෙහෙවරට දායකවීම සඳහා ප්‍රදේශයේ පවත්නා සම්පත් හා විභව ශක්තින් ප්‍රයෝජනයට ගනිමින් කෘෂිකර්මාන්තය පදනම් කරගත් කුඩා හා මධ්‍යම පරිමාණ ආදායම් උත්පාදන ව්‍යාපෘති තුළින් දේශිය ආහාර බෝග වගාව ප්‍රවර්ධනය කරමින් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම.

#### 3.1.1 ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන්

* කෘෂි නිෂ්පාදන විශේෂ ව්‍යාපෘති
* දේශීය ආහාර බෝග වගා ප්‍රවර්ධනය
* සුළු පරිමාණ වැවිලි බෝග හිමියන් රේඛිය ආයතන සම්බන්ධීකරණය තුළින් දිරිමත් කිරීම
* පුරන්වූ කුඹුරු අස්වැද්දීමේ ව්‍යෘපෘති
* පෝෂණ ප්‍රවර්ධනය සඳහා ගෙවතු වගා සංවර්ධන ව්‍යාපෘති
* පසු අස්වනු තාක්ෂණය සහ පිරිසැකසුම් ව්‍යාපෘති
* රුක් රෝපනය සහ පරිසර සංරක්ෂණ වැඩසටහන
* නවීන කෘෂි තාක්ෂණික ව්‍යවසායකත්ව දැනුම හා කුසලතා වර්ධනය

### 3.2 සත්ත්ව පාලන හා ධීවර සංවර්ධන වැඩසටහන

ප්‍රදේශයට ආවේණික තිරසාර සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති හඳුන්වා දීම තුළින් ප්‍රතිලාභීන් සඳහා රැකියා උත්පාදනය, අදාළ සේවා හා නව තාක්ෂණික පහසුකම් සැලසීම මඟින් ආදායම් තත්වය වර්ධනය කර පෝෂණ මට්ටම ඉහළ නැංවීම.

#### 3.2.1ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන්

* සත්ත්ව පාලන හා ධීවර ව්‍යාපෘති අවස්ථා ඇති කර ඒ සඳහා ප්‍රතිලාභීන් යොමු ගත කිරීම.
* ප්‍රාථමික නිෂ්පාදනවල අගය වැඩි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
* පවුලේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම පිණිස සුදුසු ව්‍යාපෘති හඳුන්වාදීම.
* ව්‍යාපෘති සඳහා සෘජුව සම්බන්ධ වන ප්‍රතිලාභීන් හා නිලධාරීන් සඳහා ව්‍යාපෘති බද්ධ දැනුම ලබාදීම.

**3.3 කර්මාන්ත සංවර්ධන වැඩසටහන**

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ දක්ෂතා හඳුනා ගනිමින් දැනුම හා කුසලතා වර්ධනය තුළින් කර්මාන්ත ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන උපකරණ, තාක්ෂණික සහාය ලබාදී ගුණාත්මක අතින් උසස් නිෂ්පාදන ඇති කිරීමට මඟ පෙන්වීම තුළින් ආදායම් මට්ටම දියුණු කරලීම.

**3.3.1ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන්**

* සුළු කර්මාන්ත ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන
* නිෂ්පාදන පදනම් කර ගත් කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන
* සහල් නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන
* විශිෂ්ඨතම කර්මාන්ත කරුවන්ගේ ජාතික ප්‍රදර්ශන සංවිධානය කිරීම.

**3.4. අලෙවි හා සේවා සංවර්ධන වැඩසටහන**

අඩු ආදායම් ලාභීන්ගේ නිෂ්පාදන අවශ්‍යතා සඳහා අලෙවි පහසුකම් සපයා වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතික මට්ටමේ අලෙවි ජාලයක් ස්ථාපිත කර දුගී බව අවම කිරීම.

**3.4.1ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන්**

* කුඩා හා මධ්‍යම පරිමාණ අලෙවි ව්‍යවසායකයින් නගා සිටුවීම
* සමෘද්ධි සහන (වරලත්) අලෙවිසැල් ඇති කිරීම
* සමෘද්ධි අලෙවි ප්‍රදර්ශන
* ජාතික මට්ටමින් විශේෂිත අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන්

## 4. ව්‍යාපෘති ඉලක්ක හා ප්‍රතිපාදන වෙන් කිරීම

4.1 ජාතික මට්ටමින් අපේක්ෂිත ඉලක්කය ව්‍යාපෘති 500,000

* වසමකින් අවම වශයෙන් ගෙවතු 20ක් සංවර්ධනය කල යුතු අතර ගෙවත්තකට .1500ක උපරිමයකට යටත්ව බීජ හා රෝපන ද්‍රව්‍ය, හා කෘෂි උපකරන නිදහස් කෙරේ. ගෙවතු වගා ව්‍යාපෘති - 300,000
* සත්ත්වපාලන හා ධිවර,කර්මාන්ත.,අලෙවි හා සේවා - 100,000
* චක්‍රිය අරමුදලින්,වෙනත් ආයතන හා දේශිය හා විදේශිය ව්‍යාපෘති වලින් - 100,000

4.2 ප්‍රතිපාදන වෙන් කිරීම

- ගම නැගුම වසම් 3060 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සඳහා එක් වසමකට රු 230,000/- ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.
- ගම නැගුම වසම් 3060 ට අයත් නොවන සෑම ග්‍රාම නිලධාරී වසමක් තුලම ජීවනෝපය සංවර්ධන ව්‍යාපෘති සඳහා රු. 70,000/- ක ප්‍රතිපාදන වෙන් කර ඇත. එම ප්‍රතිපාදන වෙන් කිරීමේ විස්තර ඇමුණුම් අංක 01හි දක්වා ඇත.
- ව්‍යාපෘතියක් සඳහා සුදුසු ඇස්තමේන්තුවක් සැකසිය යුත අතර රු.30,000 උපරිමය යටත්ව ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.

## 5. ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු උපදෙස් හා නිර්ණායකයන්

5.1. සෑම ව්‍යාපෘතියක් සඳහාම ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කල යුතුය
ප්‍රාග්ධන භාණ්ඩ /රෝපණ ද්‍රව්‍ය ලබා දීමේදී ප්‍රතිලාභියා සමඟ ගිවිසුම් ගත විය යුතුය.

5.2. අධිකාරියේ දායකත්වයෙන් 0.25 % ක මුදලක් පරිපාලන වියදම් ලෙස ගලපා ගත යුතුය.

5.3 මීට ඉහත වර්ෂ වලදී ව්‍යාපෘති ගන්වා ඇති ප්‍රතිලාභීන් මෙම වසරේ ව්‍යාපෘති වලට යොමු කල හැක්කේ අදාල ණය වාරික සියල්ල ගෙවා අවසන් කර ඇත්නම් පමණි.

5.4 විශේෂිත වූ කරුණු

* ව්‍යාපෘතිය සඳහා සුදුසු පුද්ගලයා තෝරා ගැනීමේදී අනිවාර්යයෙන්ම වසමේ සංවර්ධන නිලධාරී /ව්‍යාපෘති සම්බන්ධව කටයුතු කරන කළමනාකරු/ කලාප කළමනාකරු/ මුලස්ථාන කළමණාකරු සම්බන්ධ විය යුතුය.

* ධීවර ව්‍යාපෘති සඳහා ධීවර පරික්ෂකගේ ද, සත්ත්ව පාලන ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරීගේද, තේ වගා ව්‍යාපෘති සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේද , වෙනත් අමත්‍යාංශ වල විෂය පථයට අදාල ව්‍යාපෘති හඳුන්වා දීමේදී එම අයගේ නිර්දේශයන්ද ලබාගත යුතුය.

* සව්බල ගැන්වීමේ ඉලක්ක සාධනීය කර ගැනීම කර ගත යුතු අතර දැනටමත් කලාපයෙන් තෝරාගැනීමට උපදෙස් ලබාදී ඇති ගම්මාන සමිති 5 සම්බන්ධ කර ගනිමින් සක්‍රිය කුඩා කණ්ඩායම් සඳහා ප්‍රමුඛත්වය ලබාදීම.

* ප්‍රතිලාභීන් වෙත නිදහස් කරනු ලබන්නේ ප්‍රග්ධන භණ්ඩ , බීජ හා රෝපන ද්‍රව්‍ය, රසායනික පොහොර වර්ග පමනි.

* විශේෂිත අනුමැතිය අවශ්‍ය වන ව්‍යාපෘති - දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට ආවේනික වූ විශේෂ ව්‍යාපෘති සඳහා අදාල යෝජනා ඉදිරිපත් කිරීමටද අවකාශ ඇත.

5.5 ව්‍යාපාති යෝජනා ඉදිරිපත් කිරීම.

* වසමේ සංවර්ධන නිලධාරි ඉදිරිපත් කරනු ලබන යෝජනා වලට අදාල වාර්තාව පිළියෙළ කර කලාප කළමණාකරු, ව්‍යාපෘති භාර කළමණාකරුගේ සනාථයන්ද, ප්‍රාදේශිය

ලේකම්ගේ /සමෘද්ධිනියෝජ්‍ය අධ්‍යක්ෂගේ නිර්දේශයන්ද සහිතව දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

* ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලින් ලැබෙන ව්‍යාපෘති ඒකාබද්ධ කොට මේ සමඟ එවා ඇති ඇමුණුම් අංක 02,03,04 ආකෘති ප්‍රකාර ව්‍යාපෘති ඉල්ලීම් ඇතුලත් වාර්තාව එක් එක් වැඩසටහන(කෘෂිකර්ම, සත්ත්ව පාලන හා ධීවර, කර්මාන්ත, අලෙවි සේවා හා වෙනත්) සඳහා <u>වෙන් වෙන්ව පිළියෙළ කර දිස්ත්‍රික් ලේකම්/</u> <u>දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අනුමැතිය සහිතව</u> ප්‍රතිපාදන ලබා ගැනිමට අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 06. ප්‍රතිලාභී දායකත්වය , අධිකාරියේ දායකත්වය ආපසු අය කර ගැනීම හා ලේඛණ නඩත්තු කිරීම.

6.1 ඇස්තමේන්තු ගත පිරිවැයෙන් ප්‍රතිලාභීයා 50 % දැරිය යුතුය. ඉතිරි 50% අධිකාරියේ දායකත්වයවේ. අධිකාරියේ දායකත්වයෙන් 50%ක් උපරිම වශයෙන් මාසික වාරික 10-15අතර ප්‍රමානයකින් 5% ක පොලියක් සහිතව අයකර ගත යුතුය.

6.2 ව්‍යාපෘති සම්බන්ධව වගවීම,

නිරන්තර අධික්ෂනය, අදාල සියලුම වාරික විධිමත්ව හා අඛණ්ඩව අයකර ගැනීම.

- වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී
- ව්‍යාපෘතිභාර කළමනාකරු
- කළාප කළමනාකරු
- මූලස්ථාන කළමනාකරු / කළමනාකාර අධ්‍යක්ෂ

මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආදායම් උත්පාදන කළමනාකරුගේ රාජකාරීමය වගකීමක් වනු ඇත.

6.3 සැම ව්‍යාපෘතිලාභියෙක් වෙනුවෙන්ම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඇමනුම් අංක 05 පරිදි ඕනෑම අවස්ථාවකදි විගනනය කිරිමට ද පහසු වන පරිදි ගෙවා ඇති වාරික හා අයවිය යුත ශේෂයන් දැක්වෙන පරිදි ලේඛණයක් මූලස්ථාන කළමනාකරු විසින් නඩත්තු කල යුතුය.

## 7. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ නිදහස් කරනු ලබන උපකරණ හා වෙනත් අයිතමයන් - ඇමුනුම් අංක 06හි දක්වා ඇත.

## 8. මීට ඉහතදී නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස්

8.1. 2007.07.16, ස/අධි/10/ජා.සංගම්/චක්‍රිය අරමුදලට අදාල චක්‍රලේඛයේ අංක 03 හි ii ඡේදය පමනක් අවලංගු කරන අතර අනිකුත් සියළු කරුනු ඉදිරියටද වලංගුවේ. මීට ඉහත නිකුත් කර ඇති සියලුම චක්‍ර ලේඛ අවලංගු කරනු ලැබේ.

## 9.දැනුවත් කිරීම් හා අඛණ්ඩ පුහුණු වැඩසටහන්

ජීවනෝපාය සංවර්ධන කෘෂිකර්ම, සත්ත්ව පාලන හා ධීවර, කර්මාන්ත, අලෙවි හා සේවා වැඩසටහන් වලට අදාළව

* චක්‍ර ලේඛ සම්බන්ධ දැනුවත් කිරීම්.
* ව්‍යාපෘති කළමණාකරණ පුහුණුව
* ව්‍යවසායකත්ව පුහුණුව
* ව්‍යාපෘති බද්ධ පුහුණුව

අදාළ ක්ෂේත්‍ර අවශ්‍යතා මත ලබාදීමට කටයුතු කරනු ඇත.

## 10. ව්‍යපෘති ගැන්වීම

**10.1. 2010 වර්ෂය ආරම්භයේදී පලමුව ප්‍රතිපාදන නිදහස් කරනු ලබන්නේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වලට වන අතර ගම්මාන 3060 ට හා 3060 ට බාහිර වෙන් කිරීම් වලින්, පළමු ත්‍රෛයිමාසිකයේ ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන ඊට අදාල ව්‍යාපෘති සියල්ල 2010.03.31වන දිනට පෙර අවසන් කිරීමට සැලසුම් කර ගත යුතුය.**

**10.2. 2010. ඉදිරි මාස වලට අදාල සියළුම ව්‍යපෘති 2010 ඔක්තොබර් මාසය අවසන් වීමට පෙර අවසන් කල යුතය.**

## 11. ව්‍යාපෘති කාල රාමුව

| | |
|---|---|
| * දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීම - | 2009.12.16 - 31දක්වා |
| * ප්‍රාදේශීය මට්ටමින් යෝජනා ලබාගෙන ව්‍යාපෘති වාර්තා - පිළියෙල කිරීම | 2010.01.01 - 15දක්වා |
| * දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙන්වා ගැනීම - | 2010.01.16 - 02.16දක්වා |
| * අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම - | 2010.02.17 - 02.28දක්වා |
| * ප්‍රතිපාදන නිදහස් කිරීම - | 2010.02.17 - 02.28දක්වා |
| * ව්‍යාපෘති ආරම්භ කිරීම - | 2010.03.01දින සිට |
| * ප්‍රතිලාභී/ජනතා අයිතියට පැවරිම - | 2010.03.01 - 04.30දක්වා |
| * ව්‍යපෘති පසුවිපරම - } | 2010.10.31 දක්වා |
| * ප්‍රගති සමාලෝචනය | |

## 12. යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් පහත දුරකථන අංක අමතන්නේනම් මැනවි

| | |
|---|---|
| කෘෂි සංවර්ධන වැඩසටහන - | 0112-869824 /0112-889009 |
| සත්ත්ව පාලන හා ධීවර වැඩසටහන - | 0112-873802 /0112-889009 |
| කර්මාන්ත සංවර්ධන වැඩසටහන - | 0112-872201 /0112-889009 |
| අලෙවි හා සේවා සංවර්ධන වැඩසටහන - | 0112-872201/0112-889009 |

2010 වසර සඳහා සෑම ග්‍රාම නිළධාරි වසමකම සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරිම ඔබ වෙත පැවෙරන අතර 2009වසරේ ලද සාර්ථක අත්දැකිම් පදනම් කරගෙන එම කටයුත සැලසුම් කරගන්නා ලෙසද කාරුණිකව දන්වමි.

**සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සාර්ථික කර ගැනීමට ඔබ දැක්වූ සහය අගය කරමි.**

**ලබන්නා වූ 2010 වර්ෂය සමෘද්ධිමත් නව වසරක් වේවා!**

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

<u>පිටපත්</u>

ලේකම්,ජාතියගොඩනැගීමේහාවතුයටිතල පහසුකම් සංවර්ධනය කිරිමේ අමාත්‍යාංශය-කා.දැ.ගැ.ස.
අතිරේක ලේකම්, කලාප අංක 1,2,3,4,5,6 -කා.දැ.ගැ.ස.
සියලුම අංශ ප්‍රධානීන් -අ.ක.ස.
ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා.දැ.ගැ.ස.

**ඇමනුම් අංක 06**

## <u>ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ නිදහස් කරනු ලබන උපකරණ හා වෙනත් අයිතමයන්</u>

## 1 කෘෂි සංවර්ධන

### 1.1. කෘෂි නිෂ්පාදන විශේෂ ව්‍යාපෘති

* කාබනික පොහොර නිෂ්පාදනය - අදාල කෘෂි උපකරණ
* බිම්මල් වගා ව්‍යාපෘති - ජීවාණුහරණය කරන බැරල්, බිම්මල් ගෘහය සකසා ගැනිමට

### 1.2. දේශීය ආහාර බෝග වගා ප්‍රවර්ධනය

* කෘෂි උපකරණ (වතුර මෝටර්,දියර ඉසින යන්ත්‍ර, ඇල්කතින් වතුර බට, කොළ මඩින යන්ත්‍ර)

### 1.3 සුළු පරිමාණ වැවිලි බෝග හිමියන් රේඛීය ආයතන සම්බන්ධිකරණය තුලින් දිරිමත් කිරිම

* තවාන් සඳහා සෙවනදැල්,පොලිතින්

### 1.4 පුරන් කුඹුරු අස්වැද්දිම

* බිත්තර වී

### 1.5 පෝෂණ ප්‍රවර්ධනය සඳහා ගෙවතු වගා සංවර්ධන ව්‍යාපෘතිය

* මී මැසි පෙට්ටි ,

**1.6. පසු අස්වනු තාක්ෂණ සහ පිරිසැකසුම් ව්‍යාපෘති**

* එළවළු හා පලතුරු ඇසුරුම් කට්ටල

(ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත බීජ හා රෝපන ද්‍රව්‍ය ද බඩ ඉරිඟු වගාස සඳහා පමණක් රසායනික පොහොර ද ලබාදීමට අපේක්ෂිතය)

## 2 සත්ත්ව පාලන හා ධීවර

**2.1** කිරිගව ව්‍යාපෘති
* කිරිගවයෙක් ලබාදීම

2.2 ගව ගාල් සකස් කිරීම
* අලුතින් ගව ගාල් ඉදි කිරීම සහ අළුත් වැඩියාව

2.3 ජීව වායු ඒකක පිහිටු වීම, ජීව වායු ඒකකය සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය

2.4 එළු පාලන ව්‍යාපෘති
* එළුවන් 01 / එළිච්චියන් 03 - අවම වශයෙන් සතුන් 02 ක් වත් ලබා දිය යුතු වේ

2.5ඌරු පාලනය
* මාස 03 ට වැඩි ඌරු පැටව් 05 - අවම වශයෙන් සතුන් 02 ක්වත් ලබා දිය යුතු වේ

2.6 කුකුල් පාලන ව්‍යාපෘති
* කුකුල් පැටව්
* සෙවිලි තහඩු
* ආහාර භාජන

(සෙවිලි තහඩු, ආහාර භාජන) කුකුල් පැටවුන් 50 ට වැඩි ව්‍යාපෘති වලදී පමණක් ලබා දීය හැක

2.7 මිරිදිය ධීවර ව්‍යාපෘති
* පොකුණු සැකසීමට අවශ්‍ය අමුද්‍රව්‍ය

2.8 සුළු ධීවර ආම්පන්න
* දැල්/ඊයම් හා එම කර්මාන්තයට අදාළ උපකරණ

2.9 විසිතුරු මසුන් සඳහා
* ටැංකි සකස් කිරීම

2.10 කිරි අතුරු නිෂ්පාදන
* යෝගට් නිෂ්පාදන / බෝතල් කල කිරි අලෙවිය
ශීතකරණ / හැඳි/ භාජන / ක්‍රීම් සෙපරේට

2.11 කරවල /ජාඩි/උම්බලකඩ
* එම කර්මාන්තයට අදාළ උපකරණ

2.12 කිරි අලෙවිය සහ කිරි එකතු කිරීම සඳහා
* උණුසුම් කිරි භාජන

## 3. කර්මාන්ත

3.1 ඇඳුම් මැසීමේ කර්මාන්තය
* ජුකී මැෂින්
* ඕවර් ලොක් මැෂින්
* බොත්තම් මැෂින්

3.2 වඩු කර්මාන්තය
* බහු කාර්ය මැෂින්
* රවුටර් මැෂින්

* ජිග්සෝ මැෂින්

3.3 අනෙකුත් නිෂ්පාදන සඳහා අදාල උපකරන

* පාසැල් උපකරණ හා ලිපිද්‍රව්‍ය
* කිතුල්, පොල්, තල් ආශ්‍රිත
* දැව, උණබට ආශ්‍රිත
* පලතුරු, කෝඩියල් , ඔසුපැන්
* ආහාර විජලනය

## 4. අලෙවි හා සේවා

### 4.1අලෙවි

4.1.1සමෘද්ධි ගෘහස්ථ අලෙවි සැල්

* රාක්ක / කවුන්ටර්/සෝකේස් ( වීදුරු අල්මාරි)
* කිරුම් මිණුම් උපකරණ
* ශීතකරණ
* ඇසුරුම් උපකරණ ( සීලර් යන්ත්‍ර)

4.1.2සහල් වෙළෙඳාම

මුට්ටි /තාච්චි/බාල්දි/තරාදි උපකරණ

4.1.3ජංගම වෙළෙඳාම

* බයිසිකල් ( පාපැදි)
* මාලු පෙට්ටි/තරාදි/පිහිය
* පදික  වෙළෙඳාම සඳහා තට්ටු ( රාක්ක)

### 4.2 සේවා

4.2.1සැලුන්

* කොන්ඩ කැපීමේ උපකරණ / සැලුන් පුටු / වීදුරු කණ්ණාඩි

4.2.2වින්කල් වැඩ

* කොම්ප්‍රෙෂර් / යතුරු කට්ටලය /බකල් අච්චුව

4.2.3ආපන ශාලා /කේටරින් සේවා සපයන ආයතන

* ශීතකරණ/ගෑස් සිලින්ඩර්/ගෑස් ලිප්/විදුලි උපකරණ
* මේස පුටු/ සාස්පාන්/බුෆේසෙට් එක /බොයිලේරුව/ස්ටීමර්

4.2.4වාහන අලුත්වැඩියා

* කටර් මැෂින් ( යකඩ තහඩු කපන යන්ත්‍ර)
* කම්ප්‍රෙෂර්
* වැල්ඩින් ප්ලාන්ට් උපකරණ
* බොක්ස් ස්පැනර්/යතුරු සෙට්

4.2.5 වාහන සර්විස් සෙන්ටර්

* කම්ප්‍රෙෂර් / කම්ප්‍රෙෂර් ගන් එක /වතුර මෝටරය
* ටූල් සෙට් එක / හයි ප්‍රෙෂර් ගන් එක
* වැකුම් ක්ලීනර්

4.2.6 රූපලාවන්‍ය කටයුතු

* උඩරට ආභරණ කට්ටල / මංගල පොරු /සෙට්බැක්
* රූපලාවන්‍යාගාරයට අවශ්‍ය පුටු /හෙයර් ඩ්‍රයර්/ස්ට්‍රේට් මැෂිම/කර්ල් මැෂිම

4.2.7 ගෘහස්ථ සේවා

* ග්‍රයින්ඩර් / ඩ්‍රිල් මැෂිම / තෙල් ඉසීමේ යන්ත්‍ර

* තණ කොළ කැපීමේ යන්ත්‍ර
* ගස් කැපීමේ යන්ත්‍ර
* ලිං ඉසීමේ යන්ත්‍ර
* ගොයම් කැපීමේ යන්ත්‍ර/තේ දළු කපන යන්ත්‍ර
* ශබ්ද විකාශන යන්ත්‍ර

4.2.8 ළමා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය ලීබඩු හා උපකරණ

4.2.9 සන්නිවේදන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපතරන -

* ලැමිනේටින් මැෂින්/ඔෆ්සේට් මැෂින්

***සියලුම වැඩසටහන් වලට අදාළ ප්‍රාග්ධන උපකරණ ලබා දෙනු ලබන අතර කෘෂි සංවර්ධන , වැඩසටහන් වෙනුවෙන් පමණක් බීජ හා රෝපණ ද්‍රව්‍ය රසායනික පොහොර වැනි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ද ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.***